රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2015

මගේ අංකය :- EST-3/UNION/06/0019
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය
පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2015.05.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල  සභාපතිවරුන්

## උපදේශක සභා පිහිටුවීම සහ ආයතන සම්බන්ධීකරණ හා පසුවිපරම් කමිටු පිහිටුවීම

ඉහත කරුණුවලට අදාළව නිකුත් කර ඇති 2000.03.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2000 හා 2012.07.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 05/2012 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඉහතින් සඳහන් කළ චක්‍රලේඛයේ හා චක්‍රලේඛ ලිපියේ උපදෙස් පරිදි ඔබ අමාත්‍යාංශය, අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථාවල පිහිටුවා ඇති උපදේශක සභා සහ ආයතන සම්බන්ධීකරණ හා පසුවිපරම් කමිටු මේ වන විට  ක්‍රියාත්මක තත්ත්වයේ ඇතැයි අපේක්ෂා කරමි.

03. එසේ වුවත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2000 හි පළවන ඡේදයේ විධිවිධාන පරිදි පිහිටුවා ඇති උපදේශක කාරක සභා සහ 2006.01.10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය අනුව පිහිටුවා ඇති ආයතන සම්බන්ධීකරණ සහ පසුවිපරම් කමිටුවල ක්‍රියාකාරිත්වයන්හි කිසියම් පසුබෑමක් තිබේ නම්, එම තත්ත්වය මඟහරවා අදාළ උපදේශක සභා සහ ආයතන සම්බන්ධීකරණ හා පසුවිපරම් කමිටු නිවැරදිව පවත්වාගෙන යෑමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස මෙයින් දන්වා සිටිමි.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය